# මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය සේවා ගණයේ විදුලි කාර්මික තනතුරේ iii ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන අයදුම්පත් කැඳවීම - විවෘත

මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය සේවා ගණයේ විදුලි කාර්මික තනතුරේ iii ශ්‍රේණියේ පුරප්පාඩු 03 සඳහා පත් කර ගැනීමට සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2026.10.02 වේ.

02. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014.09.30 දිනැතිව අනුමත කරන ලද මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා PL -3-2006 A ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 7.2 වගන්තියේ විධිවිධාන අනුව 2026.01.27 දිනට පහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරින්ට මේ සඳහා අයදුම් කල හැකිය.

03. මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.
තනතුරට අදාල වැටුප් පරිමාණය : රු.42780– 10 X 490 -10 X 540 -10 X 590– 12 X 630– 66540

(i) අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. හෝ NVQ- 3 සුදුසුකම ලබා තිබීම

(ii) වෘත්තිය සුදුසුකම් : තනතුරට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 4 වන මට්ටම ( NVQ 4) නොඅඩු මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.

(iii) පළපුරුද්ද : අදාළ නොවේ.

(iv) කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරිරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(v) වෙනත්

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

Ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. මෙම තනතුර සඳහා අයදුම් කල හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි.

(v) වයස : :

අවම සීමාව : අවුරුදු 18ට නොඅඩු

උපරිම සීමාව : අවුරුදු 45 ( රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිමවයස් සීමාව අදාල නොවේ.)

(vi). බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත පරීක්ෂණයක හා ප්‍රායෝගික වෘත්තිය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණයක් පවත්වන අතර ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතුරින් ඔවුන් ලබා ගන්නා ලද ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්රායෝගික වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික වෘත්තිය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු වල සහ ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙලට බඳවා ගනු ලැබේ.

(i). ලිඛිත පරීක්ෂණය

| විෂයයන් | විෂය නිර්දේශය | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයන් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය හා ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශ අතර සම්බන්ධතා වටහා ගැනීමේලා ආපේක්ෂකයකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 01 | 100 | 40% |
| විෂයානු බද්ධ සාමාන්‍ය දැනීම | තනතුරට අදාළ රාජකාරි පිළිබඳ කරුණු ආශ්‍ර යෙන් මෙම ප්‍රශ්න පත්‍රය සකස් වේ. | පැය 01 1/2 | 100 | 40% |

(ii). වෘත්තීය පරීක්ෂණය

| විෂයයන් | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම උපකරණ සවි කිරීම, අළුත්වැඩියා කිරීම පිළිබඳ දැනුම, අදාළ ක්ෂේත්‍රයේ උපකරණ වල දෝෂ හඳුනා ගැනීම, ක්ෂේත්‍රයට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම | විදුලි උපකරණ සවිකිරීම, අළුත් වැඩියා කිරීම, විදුලි ඒකකවල /යන්ත්‍රවල දෝෂ, විදුලි රැහැන් ඇදීම, ව්‍යාප්ත කිරීම, සැලසුම් කිරීම, ගොඩනැගිවල විදුලිය අළුත් වැඩියා කිරීම | විනාඩි 30 | 100 | 40% |

(iv). අයදුම්පත් කැඳවීමේ ක්‍රමය - දැන්වීමේ පල කර ඇති අයදුම්පතේ ආකෘතියට අනුව සකස් කරගත් අයදුම්පතක් සම්පූර්ණ කර 2026.10.02 දින හෝ එදිනට පෙර ලේකම්, තැ.පෙ. 121, , මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, සංඝරාජ මාවත මහනුවර ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමුකල යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ "මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය
සේවා ගණයේ විදුලි කාර්මික තනතුරේ iii ශ්‍රේණිය සඳහා තෝරා ගැනීමට අදාල අයදුම්පත් කැඳවීම - විවෘත" ලෙස සඳහන් කල යුතුය.

දිනය 2026.09.11

ජගත් අධිකාරි
ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන,
පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය
මධ්‍යම පළාත